ආරක්ෂක අමාත්‍යාංශය

# ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ (තාක්ෂණ) - HM 1-3 (තනතුරු 01 යි)

**(නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය)**

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු විද්‍යාව / විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක්

සහ

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ අදාළ ආයතනයේ ආයතනික සාමාජිකත්වය

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

(නායයාම් අවදානම් කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත.)

**පොදු කොන්දේසි :**

වැටුප් පරිමාණය : HM 1-3 රු. (86,865-15X2,270-120,915)

වැටුප් පියවර : රු. 86,865/-

වයස් සීමාව : වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර සුදුසුකම්වලට අනුකූලව අභ්‍යන්තර අයදුම්කරුවන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

වෙනත් ප්‍රතිලාභ
* ජීවන වියදම් දීමනාව
* ආයතනයෙන් 12% ක සේ.අ.අ. (EPF) හා 3% ක සේ.භා.අ. (ETF) දායකත්වය
* රජයේ සහ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලත් වෙනත් ප්‍රතිලාභ.
* තෝරාගනු ලබන අයදුම්කරුවන්, රජයේ ස්ථාවර ක්‍රියාපටිපාටිය පරිදි ප්‍රවාහන පහසුකම් සඳහා හිමිකම් ලබයි.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ ජීව දත්ත සහිත අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමග 2023 අගෝස්තු මස 10 වන දින හෝ ඊට පෙර පහත අත්සන් කරන අය වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය,**
**99/1, ජාවත්ත පාර,**
**කොළඹ 05.**